වලපනේ ප්‍රාදේශීය සභාව - 2024
--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වලපනේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂයේ අවසාන දිනට පැවති සේවක ණය ශේෂය රු. 122,415 ක් අඩුවෙන් දැක්වීමේ දෝෂය සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සේවක ණය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	වටිනාකම රු.125,000 ක් වූ යතුරු පැදියක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඇ)	ලෙජරය අනුව සැපයුම් හා උපකරණ වියදම රු.3,621,902 ක් වුවත්, ආදායම් වියදම් ගිණුමේ එය රු.3,943,359 ක් ලෙස රු. 321,457 ක් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.204,624ක කාබනික පෙහොර තොගයක් පැවතියත්,එය රු.356,900 ක් ලෙස 152,276 වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට එක් එක් ශීර්ෂ යටතේ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා වියදමේ එකතුව රු. 2,628,357 ක් වුවත්, ආදායම් වියදම් ගිණුමේ එය රු. 2,160,801 ක් ලෙස රු.498,996 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

1.6.2. නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්ථා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ අනුරූපි වාර්තා ශේෂයන් සමඟ සැසැඳීමේදී රු.3,253,768 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් ශේෂ අදාල උපලේඛන සමඟ සැසඳිය යුතුය.

1.6.3. විගණනනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විෂයයන් 05 කට අදාළ එකතුව රු. 1,161,428 ක කර්මාන්ත ලිපිගොනු/ලේඛනගත සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් විෂයයන් සනාථ කරන අදාළ ලේඛන හා උපලේඛන පිළියෙල කර පවත්වාගත යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**			
i.	52 වගන්තිය	සමාලෝචිත වර්ෂය තුළ හඳුනාගෙන තිබුණු අනවසර ඉදිකිරීම් 38 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අනවසර ඉදිකිරීම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතන බව.	අනවසර සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
ii	93 සිට 95දක්වා වගන්ති	සභා බල ප්‍රදේශයේ සියළු වැසිකිළි හා වැසිකිළි වලවල් නිසි කාල සීමාවන් තුළදී විධිමත් ලෙස පවිත්‍ර කිරීම සඳහා ගලිරථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ගලි රථයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් වගකිව යුත්තන් වෙත ලිපි මඟින් අවස්ථා ගණනාවක දී ඉල්ලීම් කර ඇතත් මේ දක්වා ලැබී නොමැති බව.	මහජන සේවාවන් විධිමත්ව පවත්වා ගත යුතුය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
i මු.රෙ 189	2016 වර්ෂයට පෙර සිට පැවත එන එකතුව රු. 242,999 ක අගරු චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	අගරු චෙක්පත් නිරවුල් කර ගත යුතුය.
ii මු.රෙ 571 (3)	2014 සිට 2020 කාලයට අදාළ එකතුව රු.795,446 ක කාලය ඉක්ම වූ තැන්පතු 15 ක් නිරවුල් කර නොතිබුණි.	නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	කල් ඉකුත් වූ තැන්පතු නිරවුල් කළ යුතුය.
(ඇ) පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය	වරිපනම් බදු සඳහා දේපල තක්සේරුවක් වසර 05 කට වරක්වත් සිදුකළ යුතු වුවද, සභාවේ 2011 වර්ෂයේ වරිපනම් තක්සේරුවෙන් පසු නව තක්සේරුවක් සිදු කර නොතිබුණි.	නව තක්සේරුවක් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව.	නියමිත කාළය තුළ තක්සේරු වාර්ථා ලබාගෙන වරිපනම් අය කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,970,554 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,403,905 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	5,782,000	7,596,628	8,032,092	2,573,493	3,027,000	5,401,063	5,658,278	3,008,958
(ii)	කඩ කුලී	5,194,700	2,135,486	1,795,407	9,013,682	10,885,500	4,320,795	3,757,022	8,673,602
(iii)	බලපත්‍ර ගාස්තු	4,680,000	4,515,999	4,515,999	-	3,974,000	3,898,359	3,898,359	-
(iv)	වෙනත් ආදායම්	17,930,000	15,751,224	6,953,719	11,933,004	8,500,000	3,055,990	9,370,627	3,135,499
		33,586,700	29,999,337	21,297,217	23,520,179	26,386,500	16,676,207	22,684,286	14,818,059

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂයේ අවසාන දිනට මුළු හිඟ ආදායම රු.14,818,059 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ආදායම රු.23,802,066 ක් වුයෙන් සියයට 61 කින් හිඟ ආදායම් වර්ධනය වී තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි.	හිඟ ආදායම් රැස් කිරීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව.	හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	**වරිපනම් බදු**		
	සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.1,442,801 ක වරිපනම් බදු හිඟය තුළ වසර 01 ත් 05 ත් අතර කාලයක සිට වරිපනම් පරිශ්‍ර 36 කින් අයවිය යුතු රු.195,157 ක් හා වසර 05 කට වැඩි කාලයක සිට පරිශ්‍ර 60 කින් අයවිය යුතු රු.80,214 ක් ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර අය කර නොතිබුණි.	වරිපනම් බදු හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව.	පනත අනුව කටයුතු කර හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(ඇ)	**කුලී**		
i	සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.7,456,253 ක කඩකුලී හිඟය තුළ වසර 03 ත් 05 ත් අතර කාලය තුළ කඩ කාමර 10 කින් රු.2,640,005 ක් හා වසර 05 කට වැඩි කඩ කාමර 16 කින් රු.1,827,498 ක ශේෂයක් විය.	හිඟ කඩ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කරන අතර ,භූමියේ අයිතිය තහවුරු කර ගැනීමේ ගැටලුව හේතුවෙන් රාගල කඩ කාමර කුලී අයකර ගැනීමට නොහැකි වී ඇති බව .	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
i.	සභා බල ප්‍රදේශයේ 2001 සිට 2019 දක්වා කාල පරාසය තුළ බදු දී තිබුණු මස් හා මාළු කඩ 06 කින් අයවිය යුතු රු.361,855 ක් හා 1987 සිට 2001 කාල පරාසය තුළ බදු දී තිබුණු මස් හා මාළු කඩ 19 කින් අයවිය යුතු රු.887,934 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වනවිටද අයකර නොතිබුණි.	ගිවිසුම් නොමැති වීම නිසා අය කිරිම ගැටලුවක් වී ඇති බව හා බලධාරීන් දැනුවත් කර ඇති බව.	බදුකරුවන් සමග ගිවිසුම්ගත විය යුතු අතර හිග ආදායම් අය කළ යුතුය.

(ඈ) වෙනත් ආදායම්

i.	වලපනේ හා රාගල සතිපොළ බදු දී තිබූ බදුකරුවන්ගෙන් අයවිය යුතු රු.566,207 ක බදු මුදලක් වසර 05 කට වැඩි කාලයක සිට අයකර නොතිබුණු අතර නීතිමය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි.	කරුණු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
ii.	සභා බල ප්‍රදේශයේ රථ වාහන නැවතුම්පළ බදුගත් බදුකරුවන්ගෙන් අයවිය යුතු එකතුව රු.227,500 ක් වර්ෂ 04 කට වඩා වැඩි කාලයක් ගතවන තුරු අයකර නොතිබුණි.	- එම -	- එම -
iii.	සමාලෝචිත වර්ෂය අවසාන දිනට බදුපදනම මත ලබාදී තිබූ පොදු වැසිකිළි 02 කින් එකතුව රු. 688,200 ක බදු කුලිය වසර 05 ක කාලයක සිට අය කර නොතිබුණි.	- එම -	- එම -

(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිළධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.873,664 ක් හා මුද්දර ගාස්තු රු.11,059,340 ක් විය.	සිහි කැඳවීම් යොමු කර අදායම් ගෙන්වා ගැනිමට කටයුතු කරන බව.	ලැබිය යුතු ආදායම් ගෙන්වා ගත යුතුයි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්		
පදියපැලැල්ල පොදු වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා 2023 මාර්තු 27 දිනැති අංක RDA/RXJM/RE/02-Com/09/01 දරන මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති ඉංජිනේරුගේ ලිපිය මඟින් රු.2,350,000 ක් සභාව වෙත ප්‍රේෂණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටද අදාළ පොදු වැසිකිළි පද්ධතිය ඉදිනොකර වසර දෙකකට ආසන්න කාලයක් ස්ථාවර තැන්පත් තුළ ආයෝජනය කර තිබුණි.	ඉදිරියේදී මෙම මුදල වැය කර අපේක්ෂිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව.	ව්‍යාපෘතිය සම්පූර්ණ කර උපයෝජනය කළ යුතුය.

3.2. හඳුනාගත් අලාභ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබුණු රු. 2,034,735 ක අඟල් 1½ GI බට (ඝනකම මිලිමීටර් 1.2) 300 ක ඌණතාවය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් 104(4) පරීක්ෂණයක් සිදුකරනු ලබන බව.	පරීක්ෂණ පවත්වා අලාභ අය කළ යුතුය.
(ආ)	සභාවේ සේවය කර 2016 අගෝස්තු විශ්‍රාම යා යුතු තාක්ෂණ නිලධාරියෙකුට එදින සිට 2018 මාර්තු දක්වා මාස 18 ක් වෙනුවෙන් එකතුව රු.752,400 ක වැටුප් ගෙවීම සම්බන්ධයෙන් මු.රෙ 104 (4) පරීක්ෂණයක් සිදුකර තිබුණද එහි නිර්දේශ අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර නොතිබුණි.	මු.රෙ 104 (4) නිර්දේශ අනුව විශ්‍රාම පාර්තෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව.	අදාළ පරීක්ෂණ පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 සැප්තැම්බර් 28 දිනැති අංක 2020/06 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සභාවේ අතිරික්ත මුදල් සභාවට ආදායම් උත්පාදනය සිදුකළ හැකි ආකාරයේ ව්‍යාපෘති, සභා දේපල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති හෝ බහුතර ජනතාවට පොදු පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට කටයුතු නොකර එකතුව රු.38,110,996 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	ඉදිරියේදී බහුතර ජනතාවට පොදු පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට කටයුතු කරන බව.	අතිරික්ත මුදල් ප්‍රාදේශීය සංවර්ධනයට යොදා ගත යුතුය.
(ආ)	සභාවේ සේවය කරන ලද නිළධාරියෙකු විසින් සිදුකර තිබුණු රු. 3,650,000 ක වැටුප් වංචාවට අදාළව 2021 දෙසැම්බර් 31 දින අදාළ සේවකයාගේ වැඩ තහනම් කර තිබුණද, නිළධාරියා සම්බන්ධයෙන් ආරම්භ කර තිබුණු විනය පරීක්ෂණ ක්‍රියාවලිය සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටද, අවසන් කර නොතිබුණි.	මෙම පරීක්ෂණය මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් සිදු කරනු ලබන බව.	පරීක්ෂණ අවසන් කර විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඇ)	සභාව සතු පැරණි කඩ කාමර 06 ක් සහිත ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය තුළදී රු.1,713,500 ක් වැය කර නවීකරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජලය හා විදුලි පහසුකම් ලබා නොදීම හේතුවෙන් භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.	නව තක්සේරුවක් ලබාගෙන ටෙන්ඩර් කර ලබා දීමට කටයුතු කරන බව.	අවශ්‍ය පහසුකම් සලසා දී කඩ කාමර උපයොජනය කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එකතුව රු. 10,673,080 ක වාහන 16 ක් හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 04 ක් 2010 සිට 2024 දක්වා කාලය තුළ නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි.	අලුත්වැඩියා කල යුතු වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කරන අතර , භාවිතයට නුසුදුසු තත්ත්වයේ පවතින වාහන වෙන්දේසි කිරීමට කටයුතු කරන බව.	වාහන අලුත්වැඩියා කර උපයෝජනය කිරීමටත් අපහරණ කළ යුතු වාහන අපහරණ කිරීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	2022 දෙසැම්බර් 09 දිනැති අංක සීපීසී/සීඑල්ජී/විවිධ දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියට අනුව ආර්ථික අපහසුතා ඇති පාසල් දරුවන් සඳහා ආධාර ලබාදීම වෙනුවෙන් රු.2,750,000 ක් වැය කර මිළදී ගෙන තිබුණු පාසල් උපකරණ අරමුණුගත කාර්යයට යොදවා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටද, කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යයව ගබඩා කර තිබුණි.	මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව.	පාසල් උපකරණ අරමුණුගත කාර්යයට කඩිනමින් යොදවාගත යුතුය.
(ඇ)	වලපනේ නගරය තුළ පිහිටා ඇති සභාවට අයත් සතොස වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ පළමු මහලේ එක් කඩ කාමරයක් 2015 වර්ෂයේ සිටද, බිම් මහලේ වර්ග අඩි 367 ක කඩ කාමරයක් 2020 ජුනි සිටද වසා දමා නිෂ්ක්‍රීයව පැවතුණි.	සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	කඩ කාමර ඵලදායීව උපයෝජනය කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා සත්‍ය කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේදී තනතුරු 19 ක පුරප්පාඩු 39 ක් පැවතුණි.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදුවන බැවින් නව බඳවා ගැනීම් මේ වන විට සිදු නොවන බව.	පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය.
(ආ)	ස්ථාන මාරු වී ගිය, සේවය අතහැර ගිය හා වැඩ තහනම් කරන ලද සේවකයින් 31 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,265,032 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද අයකර නොතිබුණි.	සේවක ණය අය කර ගැනීම සඳහා කටයුතු කරන බව.	හිඟ සේවක ණය අයකරගත යුතුය.